www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ඉරාකයේ යුද්ධයට එරෙහිව කම්කරුවන් සහ තරුනයන් ජාත්‍යන්තරව බලමුලු ගැන්වීම සඳහා

## For an international mobilization of workers and youth against the war in Iraq

**ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ද හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ද ප්‍රකාශයනයයි**
**2007 ජනවාරි 22**

ඇමරිකාව විසින් නායකත්වය දී ඉරාකයේ ද ඇෆ්ගනිස්ථානයේ ද කර ගෙන යනු ලබන යුද්ධයන්ට එරෙහිව ජාත්‍යන්තර මහා කම්කරු පන්ති ව්‍යාපාරයක් වර්ධනය කිරීම සඳහා 2007 වර්ෂය කැප කරන මෙන් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* සහ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව ලොව පුරා සිටුනා සමාජය ගැන දැනුවත් වූ කම්කරුවන්, ශිෂ්‍යයන් හා තරුනයන්ගෙන් ඉල්ලා සිටී.

එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලා ගැනීමට එරෙහිව පැනනැගී ඇති විරුද්ධත්වය මර්දනය කිරීම සඳහා එරටට තවත් අමතර 21,500ක් හමුදා භටයන් යැවීමට තීන්දු කර සිටින බුෂ් පාලනාධිකාරය, එමගින් පෙන්නුම් කර ඇත්තේ, මේ වන විටත් ලක්ෂ සංඛ්‍යාත ඉරාක ජනයාගේ ජීවිත විනාශ කර, ඇමරිකානු භටයන් 3,000ක ගේ ද බ්‍රිතාන්‍ය, ඉතාලි, පෝලන්ත, ස්පාඤ්ඤ, යුක්රේන සහ ජ්‍යෝජියා "සහාගයේ" වෙනත් රටවල භටයන් සිය ගනනකගේ ද මරනය සිදු කර ඇති මෙම යුද්ධය තව දුරටත් උග්‍ර කරන බවය.

බැග්ඩෑඩයේ ජනාකීර්න නිවහන් ප්‍රදේශවලට ද කැරලිකාරී අන්බාර් ප්‍රාන්තයට ද එරෙහිව ඇමරිකානු වෙඩි බලය යෙදවීමට තමා සූදානම් බව බුෂ් විසින් පැහැදිලිව ම කියා ඇතුවා පමනක් නොවේ, පර්සියන් බොක්කේ නාවුක බලය ගොඩ නැගීමෙන් සහ පෙරදිග ඉරානයට හා සිරියාවට විරුද්ධව හවුල්කාරයන් පෙල ගස්සා ගැනීමට වොෂිංටනය ගෙන යමින් සිටින රාජ්‍ය තාන්ත්‍රික ප්‍රහාරයෙන් පෙන්නුම් කර තිබෙන පරිදි බුෂ් අලුත් ප්‍රහාරක යුද්ධවලට ද සූදානම් වෙමින් සිටී.

ඉරාකයේ "කැරලිකරුවන්ට ද ත්‍රස්තවාදීන්ට ද" සහාය දෙන්නන් යැයි නම් කෙරෙන ආධාර ජාලයන් "සොයසොයා විනාශ කිරීමට" බුෂ් පනවා ඇති අන මෙම රටවල් දෙකට එරෙහි ප්‍රකෝපකාරිත්වය තව දුරටත් උත්සන්න කිරීමට ද ඒවාට එරෙහි යුද ආක්‍රමනයන් කිරීමට ද කරලිය සකස් කරයි.

පසු ගිය ජූලි මාසයේ දී ලෙබනනයේ හෙස්බුල්ලා සංවිධානයට එරෙහිව ඊස්රායලය විසින් දියත් කරනු ලැබූ යුද්ධයට ඇමරිකානු පිටුබලය ලැබුනේ ඉරානයට සහ සිරියාවට එරෙහි ප්‍රහාරවල ප්‍රථම පියවර ලෙස ය. එහි දී ඊස්රායලයට අත් වූ පසුබෑම වඩාත් පලල් යුද්ධයක අන්තරාය අහෝසි කරනවා වෙනුවට, තවතවත් උග්‍ර කර ඇත. මාධ්‍ය වාර්තාවලින් කාන්දු කරනු ලැබ ඇති සවිස්තර තොරතුරුවලින් පෙනී යන්නේ ඊස්රායලය සහ එක්සත් ජනපද හමුදා 1945න් පසු ප්‍රථම වතාවට න්‍යෂ්ටික අවි යොදා ගනිමින් ඉරානයට පහර දීමට සැලසුම් සකස්කර ඇති බවය.

ෂියාවාදී ඉරානයට එරෙහිව සෞදි අරාබිය සහ ඊජිප්තුව වැනි සුන්නි බහුතරයක් වසන රටවල්වල සහාය ලබා ගැනීමට එක්සත් ජනපදය දරන උත්සාහය ඉරාකය තුල සිවිල් යුද්ධය මුලුමහත් ප්‍රදේශය ගිල ගත් සමයවාදී- නිකායවාදී ඝට්ටනයක් බවට පත් කිරීමට තර්ජනය කර සිටී.

මෙ ක්‍රියාවන් කරනු ලබමින් පවතින්නේ ලෝක මහා ජනතාවගේ අති මහත් බහුතරයේ හැඟීම්වලට කෙලින්ම විරුද්ධව ය. රටක් රටක් පාසා ජනමත විමසීම් විසින් යලි යලිත් තහවුරු කර දක්වා ඇත්තේ අති මහත් බහුතරයක් යුද්ධයට විරුද්ධ බව ය.

පසු ගිය නොවැම්බර් මැතිවරනයේ දී යුද්ධයට එරෙහිව ඡන්දය පාවිච්චි කොට ඇමරිකානු කොන්ග්‍රසයේ මන්ත්‍රීමන්ඩල දෙකෙහි ම රිපබ්ලිකානු පාලන බලය බිඳ දැමූ ඇමරිකානු මහ ජනයාගේ ප්‍රාර්ථනයන් ධවල මන්දිරය විසින් නොතකා හරිනු ලැබ තිබේ. ඉරාකය තුලම ද බොහෝ ජනයා ඇමරිකානු මිලිටරි ග්‍රහනය අවසන් කිරීමට උවමනාවෙන් සිටිනවා පමනක් නොවේ, ඔවුහු විදේශීය ආක්‍රමනිකයන්ට එරෙහි සන්නද්ධ ප්‍රහාරයන්ට සහාය ද දක්වති.

ඉරාකයේ දැවැන්ත තෙල් නිධි මත සිය තනි පාලනය තහවුරු කර ගැනීම සඳහා ද, මැද පෙරදිග සහ මධ්‍යම

ආසියාව පුරා වඩාත් පලල් විජිගීෂාවන් උදෙසා පදනම් කඳවුරක් නිර්මානය කර ගැනීම සඳහා ද ඇමරිකා එක්සත් ජනපදය ඉරාකය ආක්‍රමනය කලේ ය. සම්පත්, ලාභ ශ්‍රමය සහ වෙලඳපලවල් සඳහා මහ බලවතුන් අතර තරගය භූගෝලයේ සෑම කොටසක්ම පුරා -- මැද පෙරදිග සිට ලතින් ඇමරිකාව සහ දකුනු පැසිෆික් කලාපය දක්වා -- උග්‍රවෙමින් පවතී. අප්‍රිකාව සඳහා කොල්ලය යලිත් අලුතින් ආරම්භව සෝමාලියාව අලලා ගත් ප්‍රාදේශීය යුද්ධයක් අවුලුවා ඇති ඇමරිකානු මිලිටරි යන්ත්‍රය තම යුද ගුවන් යානා හා විශේෂ ඝාතක භට කන්ඩායම් යොදාගෙන අප්‍රිකානුවන් ඝාතනය කිරීම යලි අරඹා ඇත.

වොෂිංටනය අනාගත ආක්‍රමනයන් සඳහා සූදානම් වීම් වස් එක්සත් ජනපද යුද හමුදාවේ ද මුහුදුගත භටයන්ගේ ද ප්‍රමානය ස්ථිර ලෙසම වැඩි කිරීමට තම සැලසුම් එලියට දමා තිබේ. මෙයට ප්‍රතිචාර වසයෙන් අලුතින් නැගී එන ඉන්දියාව සහ චීනය වැනි රාජ්‍යයන් ද ඇතුලුව සියලු ප්‍රධාන බලවත්තු යුදමය ධාරිතාව ඉහල දමා ගනිමින් තම තමන්ගේ අවශ්‍යතා ආරක්ෂා කර ගැනීම සඳහා සැරසෙමින් ද සිටිති. ඇමරිකානු මිලිටරිවාදයේ ප්‍රචන්ඩ පුපුරා හැලීම ලෝක පරිමාන වන්නි ජාලාවක තර්ජනය ඉස්මතු කරමින් සකල මානව වර්ගයාට ම තර්ජනය කර සිටී.

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය විසින් ඉටු කරනු ලබන භූගෝලීය ක්‍රියා කලාපය නීතිවිරහිත බවින් ද, ගිජුබවින් ද, ඉවබව නැතිකමින් ද, වඩ වඩා සමාන වන්නේ 1939 දෙවන ලෝක යුද්ධය පුපුරා යාමට පෙර ජර්මානු හා ජපන් අධිරාජ්‍යවාදය හැසුරුනු ආකාරයට ය. 1930ස් ගනන්වල දී මෙන් දූන් යලිත් පෙනී යන්නේ අද දින ලෝක දේශපාලනයේ ගමන් මග එන්න එන්නම උග්‍ර උන්මත්තකයින් විසින් තීන්දු කරනු ලබමින් පවත්නා බව ය.

එහෙත් උන්මත්තක බවක් යයි පෙනී යන මෙම තත්වය වනාහී ලෝක ධනවාදයේ ව්‍යුහයේ ද පාලක පන්තීන්ගේ ද්‍රව්‍යමය ආසක්තයන්ගේ ද ප්‍රතිඵලය වේ. අධිරාජ්‍යවාදී යුදවාදයේ පුපුරා හැලීමේ අති මූලික හේතු පවත්නේ ලෝක ධනවාදයේ අර්බුදය තුල ය; එය වනාහී භූගෝල පරිමානයෙන් ඒකාග්‍රිත වූ ආර්ථිකයක් සහ ධනේශ්වර ජාතික-රාජ්‍ය පද්ධතිය අතර ද මහා සමාජයක සමාජමය නිෂ්පාදන සන්තතීන් සහ පෞද්ගලික දේපල මත පදනම් වූ වෙලඳපල ආර්ථිකයක අරාජක ගති ලක්ෂනය අතර ද ඝට්ටනයේ ප්‍රතිවිපාකයකි.

භූගෝලීය ආර්ථිකය පෙර නුවූ පරිදි සමීපව ඒකාග්‍රිත වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රතිසතිතා දැවැන්ත ආකාරයකින් උත්සන්න වී පවතී. ඒවා තම අතිශයින්ම සංකේන්ද්‍රිත ප්‍රකාශනය අත් පත් කරගෙන ඇත්තේ, ආර්ථික බලවතෙකු ලෙස තම තැන දිගින් දිගටම පිරිහී යාම වලක්වා ගැනීමේ අරමුන උදෙසා දනට ම දෙදරා යමින් ඇති ලෝකාධිපතියා හා සුපිරි බලවතා ලෙස තමන් දරන තත්වය කෙසේ හෝ රැක ගැනීමට වලිකමින් සිටින එක්සත් ජනපද අධිරාජ්‍යවාදයම වේ. මෙම යටත් විජිතවාදී පිලිවෙත විදේශයන් කෙරේ යුද්ධමය ප්‍රචන්ඩත්වය උග්‍ර කිරීම ද ස්වදේශය (ඇමරිකාව) තුලම සමාජ තතු සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන් කෙරේ වඩවඩාත් දරුනු ප්‍රහාරයන් එල්ල කිරීම ද ඉල්ලා සිටී.

එක්සත් ජනපදය විසින් ඉරාකයේ අරඹා ඇති යුද්ධය ඒ රට මරනයේ හා විනාශයේ අපායක් බවට පත් කර තිබේ. අඩු වසයෙන් සියදෙනෙකු දිනපතා මරා දමනු ලබන අතර ලක්ෂ ගනන් "ජනවාර්ගික විරේකයේ" ගොදුරු බවට පත් කරනු ලැබ ඇත. දස ලක්ෂ ගනන් ජනයාට පිටුවහලට පලා යාමට බල කරනු ලැබ ඇත. මෙය වනාහි ජාත්‍යන්තර කම්කරු පන්තියට එරෙහිව ගෙන යනු ලබන මෘග ප්‍රහාරයක කොටසකි.

ඇමරිකා එක්සත් ජනපදය තුල පමනක් නොව යුරෝපය, ජපානය, සහ ලෝකය පුරා ම පෙර කල යටත් විජිත ලෙස පැවති රටවල් තුල, මහ සංගත මූල්‍ය ප්‍රභූවන් ද උන්ගේ අවශ්‍යතාවලට සේවය කරන්නා වූ ආන්ඩු ද සාමාන්‍ය මහ ජනතාවගේ රැකියා, ජීවන තත්වයන්, සහ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට යෝධ ප්‍රහාර එල්ල කරමින් සිටිති. ලෝක ආර්ථිකය මත ආධිපත්‍යය දරා සිටින ජාත්‍ය'තික්‍රාන්ත මහා සංගත උපරිමව ලාභ ශ්‍රමය සොයා ලෝකය දෙවනත් කරමින් සිටිති. අරගලයේ යෙදුනු පරම්පරාවන් විසින් දිනා ගන්නා ලද සමාජ ජයග්‍රහන ක්‍රමානුකූලව මුලිනුපුටා දමනු ලබමින් පවතී.

## යුද විරෝධී ව්‍යාපාරය යලි පනගන්වනු

භූ තලය හරහා කෝටි සංඛ්‍යාත ජනී ජනයා එක්සත් ජනපද යුදවාදයට විරුද්ධව සිටිති. එහෙත් ඔවුන්ගේ ප්‍රයත්නයන් නිෂ්ඵල වී ඇත්තේ යුද විරෝධී ව්‍යාපාරයේ ඉදිරි දර්ශනය වර්තමාන බලධාරීන්ට එල්ල කෙරුනු බෙලහීන විරෝධතාවන්ගෙන් ඔබ්බට ගමන් කොට නැති හෙයිනි. දැන් අවශ්‍යව පවත්නේ අධිරාජ්‍යවාදී යුද්ධයට එරෙහිව කම්කරු පන්තියේ ඒකාබද්ධ ජාත්‍යන්තර අරගලයක් මෙහෙය වීම සඳහා නව විප්ලවවාදී ඉදිරිදර්ශනයකි.

2003 පෙබරවාරියේ දී ඇමරිකාව ඉරාකය ආක්‍රමනය කිරීමේ මුව විට දී ලෝකයේ කවර කලෙකවත් දක්නට ලැබුනු විශාලතම යුද විරෝධී පෙලපාලි විසින් එවන් ජාත්‍යන්තර අරගලයක් සඳහා පවත්නා විභව ශක්‍යතාවය විදහා දක්වනු ලැබිනි. සෑම මහාද්වීපයකම එක වර පැන නැංවුනු පෙලපාලි තුලින් එක් කෝටියකට (මිලියන 10කට) අධික ජනතාවක් වීදිවලට අවතීර්න වූවාහ.

මෙම විරෝධතා ව්‍යාපාරය සමග පැවති දේශපාලන සංකල්පනයන් - එක්කෝ මහජන මතයේ බලය මගින් වොෂිංටනය අධෛර්යමත් කොට, එසේත් නැතහොත් එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ අත්‍යාචාරයන් සීමා කිරීමට යුරෝපීය බලවතුන් ද එක්සත් ජාතීන් ද ඒකරාශී කරගෙන, යුද්ධය වලක්වා ගත හැකිය - ඉක්බිති සිද්ධීන්ගේ ගමන් මග විසින් තරයේ නිශ්ප්‍රභ කරනු ලැබ ඇත.

2003 මාර්තු හය වන දින නීතිවිරෝධී ආක්‍රමනයෙන් මාස 6ක් ඇතුලත, එක්සත් ජාතීන්ගේ මන්ඩලය ඇමරිකා එක්සත් ජනපදය විසින් ඉරාකය අල්ලාගෙන සිටීම අනුමත කරන යෝජනාවක් සම්මත කලේ ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය වනාහි සාමයට කැපවූ අපක්ෂපාත මන්ඩලයක් නොව නව යටත් විජිතවාදී යුද්ධ සූදානම් කරන හොර ගුහාවක් බව එලි දරව් වී ඇත. බුෂ් පාලනාධිකාරය විසින් ඉරාකයේ අලුත්ම යුද්ධය උග්‍ර කිරීමට ඉක්බිති, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මන්ඩලය එම කාරනය පිලිබඳව පවත්වා ගෙන ගොස් තිබෙන්නේ, කන් බිහිරි කරවන නිෂ්ශබ්දතාවයකි; ඒ අතර එය එක්සත් ජනපද පිටුබලය ලත් සෝමාලියා ආක්‍රමනයට අනුමතිය ලබා දී ඇත.

ප්‍රධාන හා සුලු සකල අධිරාජ්‍යවාදී බලවත්තු ඉරාක යුද්ධයට ගැලැතී සිටිති. බ්‍රිතාන්‍යය, ඕස්ට්‍රේලියාව, සහ පෝලන්තය කුප්‍රකට "සූදානමුන්ගේ සභාගයට" එකතු වී එක්සත් ජනපද-නීත ආක්‍රමනයට සහභාගි වීම සඳහා සිය හමුදා යෙදවූහ. ඉතාලිය, පෘතුගාලය, නෙදර්ලන්ත, ස්පාඤ්ඤය සහ නෝර්වේ යන රටවල් ද හමුදා සැපයූහ. නෝර්වේ රාජ්‍යය ද හමුදා යැවී ය. දකුනු කොරියාව භටයන් 2000ක් ද ඩෙන්මාර්කය සිය ගනනක් ද ඉරාකය තුල තබා ඇත.

එක්සත් ජනපද ආක්‍රමනයට කොල එලිය දුන් ජර්මන් ආන්ඩුව ප්‍රහාරය දියත් කිරීමට තම භූමියේ ඉඩ සපයා දී රහස් යුද තොරතුරු ද ලබා දුන්නේ ය. 2003 වර්ශයේ දී එක්සත් ජනපද-නීත ආක්‍රමනයේ විරුද්ධවාදීන් ලෙස පෙනී සිටි ජර්මනිය සහ ප්‍රන්සය ඇෆ්ගන් ජනතාවගේ ප්‍රතිරෝධ ව්‍යාපාරය මර්දනය කිරීමට යුද වැද සිටින උතුරු අත්ලන්තික් ගිවිසුම් සංවිධානයේ හමුදාවත් සමග එක්ව, එමගින් ඇමරිකාවට ඉරාකයේ යුද්ධය සඳහා හමුදා පිටත් කර යැවීමට ඉස්පාසු ලබා දී සිටිති.

රුසියාව සහ චීනය නැවත නැවතත් වොෂින්ටනයේ තර්ජනයන් හා බලපෑම ඉදිරියේ දන නමා ඇත. එක්සත් ජනපද ආක්‍රමනයෙන් ඉක්බිත්තේ ඔවුහු එරට විසින් ඉරාකය දිගින් දිගටම අල්ලාගෙන සිටීමට එක්සත් ජාතීන්ගේ අනුමැති මුද්‍රාව කැබීම සඳහා යුද්ධයේ යුරෝපයේ "විරුද්ධවාදීන්" සමග එක් වූහ. අනාගත ආක්‍රමනයන් සුජාත කිරීම සඳහා එක්සත් ජනපදය විසින් අනිවාර්යයෙන්ම යොදා ගනු ඇත්තා වූ ඉරානය සහ උතුරු කොරියාව හෙලා දක්නා එක්සත් ජාතීන්ගේ යෝජනාවලට රුසියාව හා චීනය යන දෙරට ම සහාය දී තිබේ.

ඓතිහාසික වසයෙන් අධිරාජ්‍යවාදය විසින් පීඩාවට ලක් කරනු ලැබූ රටවල්වල පාලක ප්‍රභූවන් එක්සත් ජනපද-නීත ආක්‍රමනික යුද්ධයන්ට ප්‍රතික්‍රියා කර ඇත්තේ තමතමන්ගේ ප්‍රාදේශික විජිගීෂාවන් සඵල කර ගැනීම සඳහා එය උපයෝගී කරගන්නට මාන බලමිනි. ඉරාකය සහ ඇෆ්ගනිස්ථානය යන දෙරට ම ආක්‍රමනය කිරීමට එක්සත් ජනපදයට උදව් වන පරිදි සෘජුව ම සහයෝගීත්වය දක්වූ ඉරාන ආන්ඩුව ආක්‍රමනවලින් පසු කාලයේ ක්‍රියා කර තිබෙන්නේ ඒ රටවල් දෙක ම තුල ඉරාන බලපෑම වැඩි කර ගැනීමට උදව්වන පරිද්දෙනි.

ලතින් ඇමරිකාව තුල තමන්ගේ ම සැලසුම් සහිතව සිටින බ්‍රසීල කම්කරු පක්ෂ ජනාධිපති ලුවිස් ඉනාෂියෝ දා සිල්වාගේ ආන්ඩුව 2003 වර්ෂයේ දී එක්සත් ජනපද ආක්‍රමනයට එරෙහිව ප්‍රන්සය, ජර්මනිය සහ රුසියාව සමග පෙලගැසී ගත්තේ ය. එහෙත් පසුව බ්‍රසීල ආන්ඩුව කලේ, හයිටියේ ඡන්දයෙන් තෝරා පත් කර ගැනුනු ජනාධිපති ජීන් බර්ටන් ඇරිස්ටිඩ් බලයෙන් පහකර දැමීම සඳහා එක්සත් ජනපද සැලැස්ම ක්‍රියාත්මක කිරීමට උදව් දීම්වස් එරට ආක්‍රමනය කර එහි රැඳී සිටි ඇමරිකානු මැරයින් භටයන් ඉරාකයට යෙදවීමට ඇමරිකානු පාලකයින්ට උදව් වන පරිදි, බ්‍රසීල හමුදා භටයන් හයිටියට යැවීම ය.

සිය ආක්‍රමනකාරී යුද්ධ යුක්ති සහගත කිරීමට ව්‍යාජයක් ලෙස වොෂිංටනය විසින් දියත් කරන ලද ඊනියා "ත්‍රස්ත විරෝධී ලෝක යුද්ධය" රටක් රටක් පාසා කිව නොහැකි තරම් භයංකර අපරාධ යුක්ති සහගත කිරීමට නොතැනියාවක් ලෙස පාවිච්චි කරනු ලැබ ඇත. ව්‍යාජ හේතු උඩ කරනු ලබන මෙම සංග්‍රාමය - ප්‍රතිසංස්කරනවාදී සහ ජාතිවාදී ව්‍යාපාරයන් ද ඇතුලු - අධිරාජ්‍යවාදයේ ආධිපත්‍යය යටතේ පවත්නා ලෝක පර්යායට එරෙහිව නැගී සිටිනා සියලු ම විරුද්ධ පක්ෂයන් තොගපිටින් මර්දනය කිරීම සඳහා වහන්තරාවක් ලෙස යොදා ගනු ලැබ ඇත.

උදාහරනයක් හැටියට ශ්‍රී ලංකාවේ කොලඹ ආන්ඩුව දිවයිනේ දෙමල සුලුතරයට එරෙහිව තමන් ගෙන යන යුද්ධය ඉහත සඳහන් "සංග්‍රාමයේ" කොටසක් ලෙස ප්‍රකාශ කරනු ලැබ ඇති අතර කොලඹ ආන්ඩුවට තම මෘග ක්‍රියා කරගෙන යාම සඳහා වොෂිංටනයේ සෘජු දේශපාලන හා යුද්ධමය සහාය ලැබී තිබේ.

යුරෝපයේ, මැද පෙරදිග සහ වෙනත් තැන්වල ධනේශ්වර පාලන තන්ත්‍රයන් යුද්ධයට වාචිකව විරුද්ධත්වය දක්වා ඇති ප්‍රමානයට, ඔවුන් වොෂිංටනය සමග පවත්නා මතභේදයන් හුදෙක් උපායික

ස්වභාවයක් උසුලයි; ඒවා පැන නගින්නේ ප්‍රදේශය තුල තමන්ගේ අවශ්‍යතාවලට පාඩු සිදුවේය යන බියෙනි. අවසාන විග්‍රහයේ දී ධනේශ්වර ස්ථාවරත්වයේ සහතිකකරුවා ලෙස ද විප්ලවයට එරෙහි කොටු පවුරක් ලෙස ද ඔවුහු එක්සත් ජනපද අධිරාජ්‍යවාදය මත වාරු වී සිටිති.

ගත වූ අවුරුදු හතර තීරක දේශපාලන පාඩම් සපයා දී ඇත. ඉරාකයේ යුද්ධය වේවා අනාගත අධිරාජ්‍යවාදී ආක්‍රමන වේවා ඇමරිකා එක්සත් ජනපදයේ හෝ ලෝකයේ වෙනත් තැනක නිල දේශපාලන සංස්ථාපිතයන්ට කරන්නා වූ ආයාචනයන් මගින් නවතාලිය නොහැක්කේ ය.

පලමුවන ලෝක යුද්ධයේ දී හා දෙවන ලෝක යුද්ධයේ දී මෙන් ම අද දින ද යුද්ධයට එරෙහි අරගලය වනාහි ජාත්‍යන්තර පන්ති අරගලයේ ප්‍රශ්නයකි. අධිරාජ්‍යවාදී මංකොල්ල පිලිබඳව මොනම ආසක්තයකින් හෝ බැඳී නැති වැඩ කරන ජනතාව ස්වාධීනව දේශපාලනිකව බලමුලුගැන්වීම උදෙසා යොමුවී නැති නම් සාමය සඳහා කෙරෙන ඉල්ලීම්වලට දිනාගත හැකි කිසි දෙයක් නැත. යුද්ධයට එරෙහි අරගලය පදනම් කරගත යුත්තේ ජාත්‍යන්තර සමාජවාදී මූලෝපායක් මත ය.

## එක්සත් ජනපද යුදවාදය සහ ඇමරිකානු ප්‍රජාතන්ත්‍රයේ බිඳ වැටීම

ඉරාකය තුල තම යුද්ධය ප්‍රජාතන්ත්‍රවාදය අරමුනු කරගෙන කෙරෙන්නක් යයි බුෂ් පාලනාධිකාරය කියා පාන නමුත් එම යුද්ධය උග්‍ර කිරීම විසින් සිදු කර ඇත්තේ එක්සත් ජනපදය ඇතුලතම ප්‍රජාතන්ත්‍රවාදී සන්තතීන්ගේ බිඳ වැටීම එලිදරව් වීම ය. පසු ගිය නොවැම්බරයේ පැවැත්වුනු ඡන්ද විමසීමේ දී උච්චාරනය වූ ද ලෝකය පුරා මිලියන සංඛ්‍යාත ජනකායකගේ ආධාරය ලැබුවා වූ ද, යුද්ධය කෙරේ පවත්නා, මහා-ජන විරෝධය එක්සත් ජනපදයේ දේශපාලන සංස්ථාපිතය තුල හෝ එහි ප්‍රධාන පක්ෂ දෙක තුල හෝ සැබෑ ප්‍රකාශනයක් ලබා ගත්තේ නැත.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* ඡන්ද විමසීම් දිනයේ දී ම අනතුරු හැඟවූ පරිදි, "අද දින පැවැත්වෙන කොංග්‍රස් මන්ඩල හා ආන්ඩුකාර ධුර ඡන්ද විමසීම්වල දී කුමක් සිදු වුවත්, නොවැම්බර් 7 වැනිදායින් පසුව එක්සත් ජනපදයේ වැඩ කරන ජනතාව මුහුන දෙනු ඇත්තේ ඉරාකයේ අධිරාජ්‍යවාදී යුද්ධය ද ඇමරිකාව තුලම ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට හා ජීවන තත්වයන්ට එරෙහි ප්‍රහාරයන් ද ක්‍රියාත්මක කිරීමට කැපවී සිටින්නාවූ වොෂිංටනයේ දේශපාලන තන්ත්‍රයකට ය." මෙම අනතුරු ඇඟවීම මුලුමනින්ම සනාථව ඇත.

බුෂ් ද, දේශපාලන සංස්ථාපිතය තුල සිටින්නා වූ ඔහුගේ විවේචකයන් ද අතර මතභේද උපායයන් සහ මාර්ගයන් පිලිබඳව මිසක් ප්‍රතිපත්ති හා අරමුනු පිලිබඳව නොවේ. යුද්ධය පවත්වා ගෙන යන ආකාරය පිලිබඳව කුමන පැමිනිලි ඉදිරිපත් වුව ද, සියලු දෙනාම එකඟ වන දෙය නම් ඉරාකයෙන් ඉවත්වීම ගැන සිතීමටවත් නොහැකි බවත් යුද්ධයේ දී පරදුවට තැබී ඇත්තේ තීරනාත්මක ඇමරිකානු මූල්‍ය හා භූ-මූලෝපායික ආසක්තයන් බවත් ය යන්න ය.

ඩිමොක්‍රැටික් පාක්ෂිකයන් නොවැම්බරයේ දී ජයග්‍රහනය අත්පත් කර ගත්තේ ජනයා අතර පැතිර පවත්නා යුද විරෝධී හැඟීම් නිසා වන නමුත්, එම පක්ෂයේ නායකයන් දැනටම පැහැදිලි කර ඇත්තේ ඔවුන් යුද්ධය උග්‍ර කිරීමේ බුෂ්ගේ සැලසුම්වලට එරෙහිව නැගී සිටින්නේ නැති බවය; යුද්ධය නැවැත්වීම සඳහා තමන්ගේ අතේ පවත්නා එකම මාර්ගය, එනම්: (තමන්ට ඇති කොංග්‍රස් මන්ඩල බහුතරය යොදවා ගෙන) ජනාධිපතිවරයාට එරෙහිව දෝෂාභියෝගයක් ගෙන ඒම හෝ යුද වියදම් කපා දැමීමේ යෝජනා සම්මත කිරීම කිසි සේත්ම නොකරන බවට තීන්දුවක් ඔවුන් විසින් ගනු ලැබ ඇත.

(වත්මන් ජනාධිපතිගේ පියා වූ ) ජ්‍යෙෂ්ට බුෂ්ගේ පාලනාධිකාරය සමයේ ජාතික ආරක්ෂක උපදේශකයකුව සිටියා වූ ද මෑත දී ඉරාක අධ්‍යයන කන්ඩායම විසින් කෙටුම්පත් කරනු ලැබූ සැලැස්මේ ප්‍රමුඛ සකසුවකු වූ ද බ්‍රෙන්ට් ස්කෝක්‍රොෆ්ට් මෙම නිර්දය පිලිවෙතේ පදනම ජනවාරි 4 දා *නිව් යෝර්ක් ටයිම්ස්* පුවත්පතට ලියූ ලිපියක මෙසේ අවධාරනය කලේ ය; ඉරාකය තුල පවත්නා තත්වය "වඩ වඩාත් බරපතල හා උග්‍ර වන" අතර, ඇමරිකානු විජයග්‍රහනයකින් තොරව එක්සත් ජනපද භට කන්ඩායම් එරටින් ඉවත් කරගැනීම "ඇමරිකානු ආසක්තයන්ට, මෙම ප්‍රදේශය තුල ම ද ඉන් ඔබ්බට ද ව්‍යසනකාරී විපාක සහගත විභවයකින් යුතු මූලෝපායික පරාජයක් වනු ඇත."

ස්කෝක්‍රොෆ්ට් තව දුරටත් මෙසේ ද කීයඃ "මෙහි බලපෑම ඉරාකයට සහ මැදපෙරදිගට පමනක් සීමා නොවනු ඇත. භූගෝලීය ආර්ථිකයට ප්‍රානභූත වූ බලශක්ති සම්පත් හා ප්‍රවාහනයේ ගෙල සිරකරන මර්මස්ථාන ඉමහත්සේ උග්‍ර වූ අවදානමකට භාජනය කෙරෙනු ඇත. වෙනත් ප්‍රදේශවල ද ත්‍රස්තවාදීන් හා අන්තවාදීන් ධෛර්යමත් වනු ඇත. ඉතින්, ලෝකය පුරාම සංවේදනය වනු ඇත්තේ ඇමරිකානු දැවැන්තයන්ගේ පය පැකිලී ඇති බවත්, එය තම අධිෂ්ඨානය නැති කර ගනිමින් සිටින බවත් තව දුරටත් විශ්වාස සහගත හවුල්කරුවෙකු ලෙස හෝ මිත්‍රයෙකු ලෙස හෝ - මෙම තීරක ප්‍රදේශය තුල සාමය සහ ස්ථාවරත්වය සහතික කරන්නෙකු ලෙසට මත් එය ගනන් ගත නොහැකි බවය."

මෙම ප්‍රකාශය තුල ඇමරිකානු අධිරාජ්‍යවාදයේ යුද අරමුනු පැහැදිලිව නම් කර තිබේ. ඇමරිකාව පාලනය කරන මූල්‍ය කතිපයාධිකාරය අධිෂ්ඨාන කරගෙන ඉන්නේ තම භූගෝලීය කේවලාධිපත්‍යය තහවුරු කොට යුරෝපයේ සහ ආසියාවේ තම ධනේශ්වර ප්‍රතිමල්ලයන්ට ආඥා පැනවීමට හැකි තත්වයක් උදා කර ගැනීමට තත්වයක් තමන්ට තහවුරු කර ගැනීම සඳහා, "බල ශක්ති සම්පත් ප්‍රවාහනයේ ගෙල සිරකරන මර්මස්ථානවල" පාලනය අත් පත් කර ගැනීමට ය.

ඉරාකය තුල පරාජය පිලිගැනීමත් සමග භූතලය හරහා - සහ ඇමරිකාව ද ඇතුලු - මිලියන සංඛ්‍යාත ජනයා ලවා "ඇමරිකානු දූවැන්තයාගේ පය පැකිලී ඇතැ"යි නිගමනය කරවමින් ජාත්‍යන්තරව විප්ලවවාදී නැගිටීම් උදෙසා කොන්දේසි නිර්මානය කරනු ඇතැයි ඇමරිකානු අධිරාජ්‍යවාදය බියට පත්ව සිටියි.

ලෝකයේ ජනතාවගෙන් අතිමහත් බහුතරය ඉරාකයෙන් ද ඇෆ්ගනිස්ථානයෙන් ද ඇමරිකානු " සභාගයේ" හමුදාවන් වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීම ඉල්ලා සිටින අතර, මෙම සරල සහ මානුෂික ඉල්ලීම මහ කොම්පැනි (සංගත) සහ මූල්‍ය ප්‍රභූන් විසින් පාලනය කරනු ලබන දේශපාලන ආයතනයන් තුලින් අත් පත් කර ගත නොහැකි වේ. ඔවුන්ගේ භූගෝල පරිමාන ආසක්තයන් අත්පත් කර ගත හැක්කේ ප්‍රචන්ඩත්වය මගින් ම පමනි; යුද්ධය දිගින් දිගට ම පවත්වා ගෙන යනු ලබන්නේ ඒ නිසා ය.

## එක්සත් ජනපද ඡන්ද විමසීමේ දේශපාලන පාඩම්

එක්සත් ජනපදය තුල නොවැම්බර් ඡන්ද විමසීම් සෑම රටකම කම්කරුවන්ගේ ජීවිත සඳහා තීරනාත්මක වැදගත් කමක් දරන්නා වූ ප්‍රශ්න ඉස්මතු කරයි. ගත වූ සතර වර්ෂය ඇතුලත පලල් ඇමරිකානු කම්කරු ජනතාව ලබා ඇති දේශපාලන අත්දැකීම් විසින් විදහා දක්වනු ලබන්නේ ද්වි පක්ෂ ක්‍රමය තුල වැඩ කිරීම ද ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ට බලපෑම් කිරීම ද පදනම් කර ගත් කුමන හෝ යොමුවක් වනාහි පිටවීමට දොරක් නැති වංකගිරියක් බව පැහැදිලිවම විදහා දක්වා ඇත.

2002 කොංග්‍රස් මන්ඩල ඡන්ද විමසීමේ දී ඩිමොක්‍රැටික් පක්ෂ නායකත්වය, එවිට ආසන්නව පැවති ඉරාකය ආක්‍රමනය කිරීම පිලිබඳ ප්‍රශ්නය මතු කලේ නැත; ඔවුහු එමගින් බොරු බේගල් මත පදනම්ව දියත් කෙරුනු යුද්ධයකට රට ඇද දැමීමේ කුමන්ත්‍රනය ක්‍රියාත්මක කිරීමට බුෂ් ආන්ඩුවට ඉඩකඩ ලබා දුන්හ. ඩිමොක්‍රැටික් පාක්ෂිකයන්ගේ මෙම කොඳුඇටය නැති අනුමැතිය මුදුන්පත් වූයේ 2002 ඔක්තෝබරයේ දී, යුද්ධය දියත් කිරීම සඳහා ධවල මන්දිරයට අසීමිත මුදල් අනකරයක් අනුමත කිරීමට ඔවුන් කොංග්‍රස් මන්ඩලය තුල දී ඡන්දය දීමෙනි.

2004 දී ජනාධිපතිවරනය පිලිබඳ ඡන්ද ව්‍යාපාරය එලැඹෙනවිට යුද්ධයට එරෙහි මහජන විරෝධය උග්‍රවී තිබුනි. ජනාධිපතිවරන අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා පැවැත්වුනු ඩිමොක්‍රැටික් පක්ෂයේ ප්‍රාථමික ඡන්ද විමසීම් අවස්ථාවේ දී "යුද විරෝධී" අපේක්ෂක හොවාර්ඩ් ඩීන් ප්‍රමුඛ අපේක්ෂකයා ලෙස ඉස්මතුවීම එම මහජන විරෝධය නිලවශයෙන් සලකුනු කලේ ය. පක්ෂ නායකත්වය ලඝුවෙන්ම ඩීන්ගේ ඡන්ද ව්‍යායාමය පසෙකට තල්ලු කොට ඡන්ද විමසීම යුද්ධය පිලිබඳ ජනමත විචාරයක් බවට පත් වීම වැලැක්වීමට තීන්දු කලේ ය.

කෙරී ඩිමොක්‍රැටික් පාක්ෂික අපේක්ෂකත්වය දිනා ගත් කල්හි, ඩීන් ද වෙනත් යුද විරෝධී යයි කියාගත් ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ ද කෙරීගේ යුද්ධ-පක්ෂ මැතිවරන ව්‍යායාමය පිටුපස පෙලගැසී ගත්තේ ය. අන්තිමේදී බුෂ් ම යලිත් තෝරා පත් කරගනු ලැබූ අතර යුද්ධය දිගින් දිගට ම පවත්වා ගෙන යන ලදී.

2006 අර්ධ-කාල (ඇමරිකානු ජනාධිපතිවරන වර්ෂ දෙකක් අතර මැද සමයේ දී කොන්ග්‍රස් මන්ඩලයේ තනතුරුවලින් අඩක් සඳහා පැවැත්වෙන ඡන්ද විමසීම - පරිවර්තක) ඡන්ද විමසීමේ ප්‍රතිඵලවලට ඩිමොක්‍රැටික් පක්ෂය ආධාර කලේ නැත; ඔවුන් විසින් ඒවා සාදරයෙන් පිලිගනු ලැබුවේ ද නැත. අසාර්ථක වෙමින් පැවති එක්සත් ජනපද යුද මෙහෙයුම බේරා ගැනීම සඳහා ද වැඩෙන්නා වූ යුද විරෝධී හැඟීම අවමංගත කිරීම සඳහා ද දරන ලද ප්‍රයත්නයක් තුල දී ප්‍රමුඛ ඩිමොක්‍රැටික් පාක්ෂිකයෝ ද රිපබ්ලිකන් පාක්ෂිකයෝ ද ඉරාකය තුල සාර්ථක විසඳුමක් ලබා දීම "ද්විපාක්ෂික ඉරාක අධ්‍යයන කන්ඩායම" අතින් ඉටු වෙනු ඇතැයි අපේක්ෂා කිරීමට මහජනයා ඇනවූහ.

යුද ජය උදෙසා බුෂ්ගේ මූලෝපාය අසාර්ථක එකක් යයි පිලිගන්නා අතර ම ඇමරිකානු හමුදා ඉරාකයෙන් ඉවත් කර ගැනීම ඉක්මනින් නොකට යුතුය යි තීන්දු කල මෙම කන්ඩායම් වාර්තාව පැය කීපයක් ඇතුලත ධවල මන්දිරය එම යෝජනා ද ප්‍රතික්ෂේප කලේ ය. ඉරාක අධ්‍යයන කන්ඩායම මල අකුරක් බවට පත් විය.

ඇමරිකානු ජනතාව ඉල්ලා සිටින්නේ සාමය ය. එහෙත් ඔවුන්ට ලැබී තිබෙන්නේ යුද්ධය ය. ජන මාධ්‍යයෝ බුෂ් පාලනාධිකාරය විසින් ඉරාකය තුල ගෙන යමින් පවත්නා යුද්ධයට ද ඉරානයට එරෙහි යුද සෝසාව උග්‍රකිරීමට ද පක්ෂව පෙල ගැසී සිටිති.

තමන්ගේ රටතුල පවත්නා යුද විරෝධී හැඟීමට ඇමරිකානු පාලක ප්‍රභුව දක්වන ආකල්පය මුලු ලොව පුරාම අන් (රටවල) පාලක පන්තීන් අතර ද පුනර්කෘතව පවතී. බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂ අගමැති ටෝනි බ්ලෙයාර්, ඕස්ට්‍රේලියාවේ කොන්සර්වටිව් අගමැති ජෝන් හොවාර්ඩ් යනාදීහු බහුතරයේ විරුද්ධත්වය නොතකා හැර ඉරාක යුද්ධයට දිගින් දිගට ම සමත්ව සිටින්නේ

මේ දෙරටේ ම දේශපාලන සංස්ථාපිතයේ දූෂ්සභාය නිසා ය. සෑම තැනකම මහ ජනයාගෙන් අති මහත් වැඩි ජනතාවට ඡන්ද බලය අහෝසි කිරීම සැබැවින් ම සිදු කරනු ලැබ ඇත.

සෑම මහාද්වීපයක ම වැඩ කරන ජනයා සඳහා පවත්නා එකම විසඳුම වන්නේ ආන්ඩුවලටත්, සංස්ථාපිතයේ පක්ෂවලටත් ස්වාධීනව හා ප්‍රතිවිරුද්ධව ක්‍රියාත්මකවී නව ජාත්‍යන්තර සමාජවාදී දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නගාගැනීම ය. ඉරාකයේ සහ ඇෆ්ගනිස්ථානයේ යුද්ධවලට එරෙහි සියලු වර්ගවල ජනතා බලමුලුගැන්වීම්- අධ්‍යාපන ව්‍යායාමයන්, රැස්වීම්, සහ පෙලපාලි, කාර්මික ක්‍රියා, මැතිවරන ආරම්භකත්වයන් - සංකල්පනය කර ගත යුත්තේ ද වර්ධනය කරගත යුත්තේ ද මෙම ස්වාධීන දේශපාලන මූලෝපායේ පදනම මත ය.

## යුද්ධය සහ සමාජ අසමානතාව

ඉරාකයේ යුද්ධය පිලිබඳව ලෝකයේ ආන්ඩු සහ පෘථුල මහා ජනකාය අතර පවත්නා මහා අගාධය ලෝක ධනවාදයේ යටින් දිවෙන සමාජ ආර්ථික යථාර්ථය ප්‍රතිබිම්බනය කරයි. ගතවූ අවුරුදු විසි පහ තුල පෙර නුවූ විරූ පරිදි සමාජ අසමානතාවය වර්ධනය වී පවතී.

මූල්‍ය වංශාධිපති ස්ථරයක් විසින් ලෝක ජනතාවගේ අතිමහත් බහුතරයකගේ වියදමෙන් අති දැවැන්ත ධන සම්භාරයක් තම තනි අයිතියට යටත් කර ගෙන ඇති අයුරු පසු ගිය වර්ෂයේ අග දී එක්සත් ජාතීන් හා අනුබද්ධ පර්යේෂන සංවිධානයක් විසින් ලිපි ලේඛන මගින් තහවුරු කර තිබේ.

වර්ල්ඩ් ඉන්ස්ටිටියුට් ෆෝ ඩිවෙලොප්මන්ට් ඉකොනමික් රිසර්ච් (ආර්ථික සංවර්ධන පර්යේෂන සඳහා වූ ලෝක ආයතනය) විසින් පෙන්නුම් කර ඇති පරිදි ලෝකයේ වැඩිහිටි ජනකායෙන් ධනවත් ම සියයට එක (මිලියන 37ක ජනයා) ලෝක ධනයෙන් සියයට 40ක් අයිති කර ගෙන සිටිති. ධනවත් ම සියයට දෙක ගත හොත් ලෝක ධනයෙන් සියයට 50කට වැඩි ප්‍රමානයක් ද ඉහල ම සියයට දහය, සියයට 85ක් ද අයිති කර ගෙන සිටිති.

මෙයට විසන්ඳනීයව ලෝකයේ වැඩිහිටි ජනගහනයේ දුප්පත් ම අර්ධයට - එනම් මිනිසුන් බිලියන 1.85කටම අයත්ව පවත්නේ ලෝක සම්පත්වලින් සියයට එකක් පමනි. අති මහත් බහුතර ජනකාය ඝෝර දිලිඳුබවේ ද සාගතයේ ද රෝගී භාවයේ ද නිමග්නව දිවි ගෙවීමේ සන්තෑසියට ගොදුරුව සිටිති.

ඇමරිකා එක්සත් ජනපදයේ ද යුරෝපයේ ද රුසියාවේ ද ලතින් ඇමරිකාව, අප්‍රිකාව හා ආසියාව පුරා ද විවිධ දේශපාලන වර්නයන්ගෙන් යුත් සියලුම ආන්ඩු සමාජ ධනයේ ප්‍රගාමීව වැඩිවන්නා වූ පංගුවක් වැඩ කරන ජනතාවගෙන් පැහැරගෙන සමාජය මුදුනේ අරක් ගත්, ධනයෙන් උස්මෘත්ත වූ ප්‍රභුවක් අතට මාරු කර දීමේ ප්‍රතිවිපාකය ලෙස යෝධ සමාජ ප්‍රතිවර්තනයක් සිදු වී තිබේ. මේ සෑම තැනකම ප්‍රතිවිපාකය සාරභූත වසයෙන් එකකි; එනම්: ජනගහනයෙන් අති මහත් වැඩි සංඛ්‍යාවක් වූ කම්කරු පන්තියට තමන්ගේ අවශ්‍යතා, සිතුම් පැතුම් හා ආසක්තයන් සන්තර්පනය කිරීමේ මග අහුරා දමන මූල්‍ය කතිපයාධිකාරයක් පැලපදියම් වී ගැනීම ය.

## ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාරය

සෘජුව ම පෝසතුන්ගේ ද සුපිරි පෝසතුන්ගේ ද අවශ්‍යතා සන්තර්පනය කෙරෙන ප්‍රතිපත්තීන් සාම්ප්‍රදායික ප්‍රජාතන්ත්‍ර විධික්‍රම හරහා ක්‍රියාත්මක කල නොහැකි ය. ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිව දැන් එල්ල වන පෙර නුවූ විරූ ප්‍රහාරයේ සැබෑ හේතුව වන්නේ මහජන විරෝධය පුපුරා යාමට එරෙහිව රාජ්‍යයේ මර්දන බලය වර්ධනය කර ගැනීම ය; බාහිර ත්‍රස්තවාදී තර්ජනයන්ගෙන් ජනයා ආරක්ෂා කිරීම නොවේ.

ඇමරිකා එක්සත් ජනපදය තුල, බුෂ් පාලනාධිකාරය ඩිමොක්‍රැටික් පක්ෂයේ ද ජනමාධ්‍යවල ද සහාය ඇතිව ක්‍රියාත්මක කර තිබෙන ප්‍රජාතන්ත්‍ර-විරෝධී පියවර සමස්තයක් වසයෙන් පොලිස් රාජ්‍යයක් සඳහා නීතිමය හා ආයතනමය රාමුවක් දැනට ම තනා තිබේ.

ආන්ඩුවේ රහස් ඔත්තු පරීක්ෂනයන්ට මහජනයා ගොදුරු කිරීම මගින් පෞද්ගලික නිදහස මලඅකුරක් බවට පත් කර ඇත. නඩු විභාගයක් සඳහා ද නීති උපදේශ සඳහා ද වූ අයිතීන් සහ ශතවර්ෂ ගනනාවක් පැවති හබෙයාස් කෝපුස් මූලධර්මය අබල කොට ඇත. පක්ෂ දෙකේම සහාය ඇතිව සම්මත කරන ලද නීති මගින් රහස් සිරගෙවල් හා වධදීම අනුමත කර තිබේ. ජිනීවා සම්මුතියෙන් ද වෙනත් ජාත්‍යන්තර නීති මගින් ද නියම කරන ලද ආරක්ෂාවන්ට ආයාචනය කිරීමට උසාවිවල පැවති අවස්ථා දැන් අහෝසි කර තිබේ. එක්සත් ජනපදයේ මේ මර්දනකාරී ක්‍රියාකාරකම් ලෝකය පුරාම පාලකයන් විසින් අනුකරනය කරනු ලැබේ. 2005 දී බ්‍රිතාන්‍යයේ සම්මත කල ත්‍රස්තවාදය මර්දනය කිරීමේ පනත (චෝදකයන් ඔහුගේ වරද ඔප්පු කරන තෙක් චූදිතයා නිවැරදිකරුවෙකු ලෙස සැලකිය යුතු ය යන) නිර්දෝෂිතාවේ පූර්ව අභ්‍යුපගමනය පිලිබඳ පදනම් අධිකරන මූලධර්මය අහෝසි කොට රුඳවියන් චෝදනා ඉදිරිපත් නොකොට දිගු කාලයක් අත්අඩංගුවේ තබා ගැනීමට ආන්ඩුවට ඉඩකඩ ලබා දුනි. 2001, සැප්තැම්බර් 11 ප්‍රහාරයන්ගෙන් ඉක්බිති පස් වසර තුල ඕස්ට්‍රේලියාවේ හොවාර්ඩ් ආන්ඩුව වෙන වෙනම ප්‍රති ත්‍රස්තවාදී නීති 40ක් ක්‍රියාත්මක කර තිබේ. ලෝක ජනතාවගේ අයිතීන් මෙයට පෙර කවර කලෙකවත් මෙතරම් තර්ජනයකට ලක්ව තිබී නැත.

## යුද්ධයේ හා ප්‍රතිගාමිත්වයේ පක්ෂයන් ගෙන් බිඳී වෙන් වෙනුදු යුද්ධයට එරෙහි ස්වාධීන මහා ජනතා ව්‍යාපාරයක් උදෙසා !

ඉරාකයේ යුද්ධය අවසන් කිරීමට යතුර වන්නේ වැඩ කරන ජනතාව සහ තරුනයන් සකල දේශපාලන සංස්ථාපිතයට ද එය සේවය කරනා මූල්‍ය කතිපයාධිකාරයට ද විරුද්ධව සාමාජිකව සහ දේශපාලනිකව ස්වාධීනව මැදිහත් වීම ය.

යුද්ධය වනාහී සියලු සමාජ අවශ්‍යතාවන් මහ සංගතවල ලාභ ගැරීමට ද ඉතා පටු ප්‍රභූවකගේ පෞද්ගලික ධන සමුච්චයට ද යටත් කරනු ලැබූ සමාජයක අනිවාර්ය ප්‍රතිඵලයයි. යුදවාදයේ වැඩී ඒම සහ අධිරාජ්‍යවාදී යුද්ධය ක්‍රියාත්මක කිරීම පිලිබඳ ප්‍රශ්නය ඉන් වාසි ලබන්නේ ද ලාභ ලබන්නේ ද කවුරුන්ද යන ප්‍රශ්නයන් වෙන් කල නොහැකි ය.

යුදවාදයට හා යුද්ධයට විරුද්ධව කරන අරගලය සමාජ අසමානතාවට එරෙහිව ද, ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එල්ල කරන ප්‍රහාරයන්ට එරෙහිව ද කරන අරගලය සමග සම්බන්ධ කරන්නා වූ වැඩ පිලිවෙලක් සම්මත කරගත යුතු ය. එය පවත්නා ධනේශ්වර සංස්ථාපිතයට සෘජුව ම අභියෝග කරමින් ආර්ථික ජීවිතය ජාත්‍යන්තරව සමාජයේ අවශ්‍යතාව සහ පොදු යහපත පදනම් කොට, එනම් සමාජවාදී අත්තිවාරමක් මත ප්‍රති සංවිධානය කිරීම සඳහා සටන් කල යුතු ය.

*ලෝක සමාජවාදී වෙබ් අඩවිය* පහත සඳහන් පිලිවෙත් මත යුද්ධයට එරෙහිව පොදු ජන ව්‍යායාමයක් ගොඩ නැගීම සඳහා කම්කරුවන් ශිෂ්‍යයන් සහ තරුනයන් කැඳවා සිටී:

- එක්සත් ජනපද, බ්‍රිතාන්‍ය හා වෙනත් 'සහාග' හමුදා ඉරාකයෙන් සා ඇෆ්ඝනිස්තානයෙන් වහාම ද කොන්දේසි විරහිතව ද ඉවත් කර ගැනීම

ඉරාකය තුල ඇමරිකානු හමුදා රැඳී සිටිනතාක් එරටේ ලේ හැලීම වලක්වා ලිය නොහැකි ය. ඉරාක ජනතාව මතට කඩා පාත්වී ඇති මහා ව්‍යසනය වනාහී ගතවූ ශතවර්ෂ කාර්තුව (අවුරුදු 25) තුල එම රට සහ එක්සත් ජනපදය අතර පැවැති ගැටුමේ ප්‍රතිවිපාකයකි: 1980 ගනන්වල දී ව්‍යසනකාරී විපාක සහිත වූ ආක්‍රමනයකට කුවේටය භාජන කිරීමට ඇමරිකාව විසින් ඉරාක පාලනයට ධෛර්යය දීම, 1991 දී එක්සත් ජනපදය විසින් ඉරාකය ආක්‍රමනය කිරීම, දොලොස් වසරක ආර්ථික තහංචි, සහ අන්තිමේ දී 2003 එරට ආක්‍රමනය කර අල්ලා ගැනීම, මේවා වනාහී ඉරාක සමාජය සැබැවින්ම භග්න කර දැමීමට මග පෑදූ සිද්ධීන් වේ. ඉතිහාසය මෙසේ වන හෙයින් ඇමරිකානු හමුදා එරටින් වහාම හා මුලුමනින්ම ඉවත්වීම වනාහී එම රට හෂ්ම කෙරෙමින් පවත්නා ප්‍රචන්ඩත්වය අවසන් කිරීමට පරම වසයෙන්ම අවශ්‍ය වූ පූර්ව කොන්දේසියකි.

- යුද්ධයට වග කිවයුත්තන් නීතිය ඉදිරියට ගෙන එනු.

ඉරාකයට එරෙහි අප්‍රකූපිත ආක්‍රමනය සංවිධානය කල එවුන්ට එරෙහිව යුක්තිය පසිඳලීම තීරනාත්මකව අවශ්‍යවේ. මෙයට බුෂ් ද, චේනි ද, රම්ස්ෆෙල්ඩ් ද, රයිස් ද අනෙකුත් ඉහල සිවිල් හා මිලිටරි නිලධාරීන් ද බ්‍රිතාන්‍යයේ බ්ලෙයාර් සහ ඕස්ට්‍රේලියාවේ හොවාර්ඩ් ද, ඇතුලත් ය. තමන් විසින් යුද ආධාරකරුවන් යයි ලේබල් ගසනු ලබන, පැනමාවේ නොරියේගා, සර්බියාවේ මිලෙසොවික්, සහ ඉරාකයේ සදාම් හුසේන්, වැන්නවුන් සිරගත කිරීමට ඇමරිකා එක්සත් ජනපදය අවධාරනයෙන් පියවර ගෙන ඇත. ඉහත සඳහන් නායකයන්ගේ අපරාධවලට වඩා අතිශයින්ම දරුනු වූ අපරාධවල කතුවරුන් වන වොෂින්ටනයේ යුද අපරාධකරුවන්ට ද එම ප්‍රමිතිය ම යෙදිය යුතු ය.

දෙවන ලෝක යුද්ධයේ නාසීන් පරිද්දෙන් ම බුෂ්ගේ ධවල මන්දිරය ද "නිවාරක යුද්ධයක්" එනම් තම භූගෝලීය අරමුනු ජය ගැනීම ඉලක්ක කර ගත් ආක්‍රමනකාරී යුද්ධයක් දියත් කර තිබේ. නියුරෙම්බර්ග් යුද අපරාධ නඩුවේ දී ගෙන එන ලද ප්‍රධාන චෝදනාව ද ආක්‍රමනකාරී යුද්ධයක් ඇරඹීම ය.

බුෂ් සහ අනෙකුත් ප්‍රධාන නිලධාරීන් යුද අපරාධවලට වග කිව යුතු යයි පෙන්වා දීම පලිගැනීම පිලිබඳ ප්‍රශ්නයක් නොවේ. එය වනාහී මුලු ජනගහනයම දේශපාලන වශයෙන් අධ්‍යාපනගත කර ගැනීම පිලිබඳ කරුනකි. සෑම අවුරුදු හතරකට ම පහකටම වරක් ප්‍රමුඛ ඇමරිකානු යුද්ධමය ආක්‍රමනයන් යුක්ති සහගත කිරීම උදෙසා එක්සත් ජනපද පාලක ප්‍රභූව විසින් ද ඔවුන්ගේ සේවකයන් විසින් ද පෝෂනය කර ඇති යුදවාදී සංස්කෘතිය අවසාන කර දැමීම අත්‍යවශ්‍යවේ. සාපරාධී කුමන්ත්‍රනයන් මගින් මෙම ලේවැකි අපරාධ ක්‍රියාත්මක කල අයුරු හෙලිදරව් කිරීම ද අත්‍යවශ්‍යය.

- සකල වර්ගයකම වර්ගවාදයට, ජාතිකවාදයට සහ ආගම්වාදයට එරෙහි වනු.

යුද්ධයට එරෙහිව ඒකාබද්ධ ජාත්‍යන්තර ව්‍යාපාරයක් ගොඩනැගීමේ පූර්ව කොන්දේසියක් වන්නේ සකල වර්ගයේ ම වර්ගවාදය ජාතිකවාදය සහ ප්‍රජාගනවාදය ප්‍රතික්ෂේප කිරීමයි.

ඉරාකයේ යුද්ධය සමග අත්වැල් බැඳගෙන අධිරාජ්‍යවාදී ආක්‍රමනය ද නව-විජිතවාදී පාලනය ද යුක්තිසහගත කිරීම උදෙසා වර්ගවාදය උසිගැන්වීම කරනු ලැබේ. යුරෝපයේ ද වෙනත් තැන්වල ද මුස්ලිම්වරුන් වාර්ගික ස්වෝත්තමවාදී ඒකාධිපතිත්වයේ ද අපහාසයේ ද ගොදුරු බවට පත්ව ඇත. රටක් රටක් පාසා පාලක ප්‍රභූව වැඩ කරන ජනතාව භේද කිරීම සඳහා ද අනාගත

යුද්ධයන්ට සහාය උසිගන්වාගැනීම සඳහා ද "ජාතික සාරධර්ම" වගා කරමින් සිටිති.

දැනට ම ඉරාකය තුල නිකායවාදී රුධිර ස්නානයක් නිර්මානය කොට මුලු ප්‍රදේශයම සට්ටනයකට ඇද ලීමට තර්ජනය කරන්නා වූ ජනවාර්ගික සහ ආගමික මතභේද අවුලුවා ලීම මැදපෙරදිග සකල වැඩ කරන ජනතාව විසින් ප්‍රතික්ෂේප කල යුතු ය. අධිරාජ්‍යවාදී ආක්‍රමනයට සහ මුස්ලිම් විරෝධී වර්ගවාදයට පිලිතුර වන්නේ පාලක ප්‍රභූවේ ඒ හෝ මේ කොටසට අනිවාර්යයෙන් ම සේවය කරන්නා වූ ඉස්ලාමීය මූලධර්මවාදය කරා පසු බැසීම නොවේ; කල යුතුව ඇත්තේ මැද පෙරදිග පුරා වැඩ කරන ජනතාව ලෝකය පුරාම තම පන්ති සහෝදර සහෝදරියන් සමග සමාජවාදී ජාත්‍යන්තරවාදයේ පදනම උඩ ඒකාබද්ධ කිරීම ය.

- මහජනයාගේ ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහිවූ සියලු නීති සහ ප්‍රතිපත්ති අහෝසි කරනු. ආන්ඩු චරපුරුෂ සේවා සහ දේශපාලන මර්දනය අහෝසි කරනු. මර්දනය කිරීමේ සිරගත කිරීමේ හා පිටුවාහල් කිරීමේ බියෙන් තොරව තමන් තෝරාගෙන තිබෙන රටක් තුල ජීවත් වීමට හා වැඩ කිරීමට සංක්‍රමනික කම්කරුවන්ට ඇති අයිතිය ආරක්ෂා කරනු.
- අධිරාජ්‍යවාදී යුද්ධය සඳහා බලහත්කාරයෙන් බඳවා ගැනීම ඇරඹීමට එරෙහි වනු. එය ප්‍රතික්ෂේප කරනු.
- ධන සම්පත්වල දැවැන්ත අසමානතාවන් අවසන් කිරීම උදෙසා ආර්ථික ජීවිතය සමාජවාදී පිලිවෙත් මත ප්‍රති නිර්මානය කරනු. සමාජ සමානතාවය පෝෂනය කොට ජනතාවගේ අවශ්‍යතා සම්පාදනය කරනු.

කර්මාන්තයේ හා මූල්‍ය සම්පාදනයේ සියලු බලවේග පුද්ගලික අයිතියට යටත් කර ඇති වර්තමාන ධනේශ්වර පද්ධතියල ආර්ථිකය පොදු ජන අයිතියට පත් කරන්නා වූ ද ප්‍රජාතන්ත්‍රීය පාලනයට භාජන කරන්නා වූ ද සමාජවාදී පද්ධතියක් මගින් විස්ථාපනය කල යුතු ය. ධනේශ්වර වෙලඳපොලේ අරාජක ක්‍රියාකාරිත්වය අතික්‍රමනය කොට, ලාභ නිර්මානය සහ දැවැන්ත පෞද්ගලික ධනය ගොඩගසා ගැනීම නොව මානව අවශ්‍යතාවන් සන්තර්පනය කිරීම තම සංවිධායක මූලධර්මය කොට ගත් ආර්ථික පද්ධතියක් වර්ධනය කිරීම සඳහා විද්‍යාවේ සහ තාක්ෂනයේ සිදුව ඇති විප්ලවකාරක වර්ධනයන් ජාත්‍යන්තර පරිමාවක යොදා ගැනීමට සමත් ආර්ථික පද්ධතියක් ස්ථාපනය කල යුතුව ඇත.

- අධිරාජ්‍යවාදී යුද පිලිවෙතට එරෙහිව සකල වැඩ කරන ජනතාවගේ ජාත්‍යන්තර සහෝදරත්වය සඳහා ද දිලිඳුකම, ලෙඩ රෝග, සහ නූගත්කම යනාදී වසංගතයන් භංග කර දැමීම උදෙසා සියලු මනුෂ්‍ය වර්ගයාගේ ජීවන ප්‍රමිතීන් සහ සංස්කෘතික මට්ටම ඉහල දැමීම සඳහා ලෝකයේ සම්පත් වර්ධනය කිරීම උදෙසා ද සමාජවාදී ජාත්‍යන්තරවාදී පිලිවෙතකට සටන් වදිනු.

යුදවාදයට, ජාතිකවාදයට ආගම්වාදයට හා වර්ගවාදයට එරෙහි එකම ප්‍රගතිශීලී විකල්පය වනාහී සමාජවාදී අනාගතයක් උදෙසා අරගලය තුල දී කම්කරු පන්තිය ජාත්‍යන්තරවාදීව එක්සත් කිරීම වේ.

යුද්ධයට පීඩනයට සහ සමාජ අසමානතාවට එරෙහිව වැඩ කරන ජනතාව ගේ අරගලයන් ජාත්‍යන්තරව ඒකාබද්ධ කිරීම වනාහී ලෝක සමාජවාදී ව්‍යාපාරයේ නායකත්වය වූ හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් භාර ගෙන ඉටු කරමින් සිටින්නා වූ ඓතිහාසික කර්තව්‍යය ය.

මෙම අරගලය ඉදිරියට ගෙන යා යුත්තේ ජාත්‍යන්තර කමිටුවේ ශාඛාවන් වූ සමාජවාදී සමානතා පක්ෂයන් පවත්නා රටවල් තුල එම පක්ෂ ගොඩ නැගීමෙන් හා ප්‍රසාරනය කිරීමෙන් ද ඒවා නොමැති රටවල එම පක්ෂ පිහිටුවීමෙන් ද වේ. සෑම රටකම සමාජවාදී සමානතා පක්ෂය සටන්වැද සිටින්නේ යුද්ධයට එරෙහිව සහ සමාජවාදය උදෙසා ය; ජාත්‍යන්තර බැංකු සහ අන්තර්ජාතික සංගතවල ඒකාධිපතිත්වයට එරෙහිව ය.

මෙම ඉදිරි දර්ශනය සඳහා සටන් වදින ලෙස අපි තරුනයන්ට විශේෂ ආයාචනයක් කර සිටිමු. යුද්ධයේ භයංකර වියදම දරා සිටීමට සිදුවන්නේ, ප්‍රථමයෙන්ම ඔවුන්ට ය. විශ්වවිද්‍යාලවලත් ද්වීතීයික පාසැල්වලත් තරුනයින්, යුද්ධය සහ එයට උපත දෙන්නා වූ ලාභ ගරන පද්ධතිය අවසන් කිරීමට පොහොනා ජනතා මහා සමාජවාදී ව්‍යාපාරයක් ගොඩනැගීමේ අරගලය උදෙසා තරුනයන් සමස්තයක් ලෙස කම්කරු පන්තිය දිශාවට යොමු කරවීම අරමුනු කර ගත් "සමාජ සමානතාවය සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයන්" නම් සංවිධානය සෑම රටක ම විශ්වවිද්‍යාල හා ද්වීතීයක පාසල් තුල ගොඩ නගන ලෙස අපි කැඳවා සිටිමු.

© www.wsws.org